සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

## චිත්‍ර කලාව - I

පැය එකයි
One hour

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පහත රූප සටහන ඇසුරුකරගෙන අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





01 මෙම රූපයෙන් දැක්වෙන්නේ මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ ........................................ යි.

02 ........................................ යුගයට අයත් මෙම සුවිශේෂී නිර්මාණය මල් ආසනයට පසුබිමක් මෙන්ම අලංකාරයක් ද ගෙන දෙන්නකි.

03 මෙම නිර්මාණයේ පහළ කොටස කළු ගලින් සකස් කර ඇති අතර ඉහළ කොටස ........................................ නිර්මාණය කර තිබේ.

04 ඉහළ කොටසේ ඉදිකර තිබූ විමාන තුළ ........................................ තැන්පත් කර තිබූ බවට සාධක හමුවේ.

05 මෙම නිර්මාණය දෙපස ගල්ටැම් දෙකක් දක්නට ලැබෙන අතර එහි ශීර්ෂය ලෙස ඇත්, අස්, ගව, සිංහ රූ යොදා තිබීමෙන් ........................................ සංකේතවත් වේයැයි පැවසේ.

• අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

06 දකුණු ඉන්දීය විජයනගර් ගෘහ නිර්මාණ ලක්‍ෂණ මූලික කරගෙන ගම්පල යුගයේ ඉදිකරන ලද විහාරය කුමක් ද?

.................................................................................................................................

07 දෙගල්දොරුව විහාරයේ වෙස්සන්තර ජාතකය සිතුවම් කළ ශිල්පියා කවුරුන් ද?

.................................................................................................................................

08 රෝමයේ සිස්ටයින් දෙව්මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ සිතුවම් කර ඇති අන්තිම විනිශ්චය (Last Judgment) නැමති ප්‍රෙස්කෝ සිතුවම අඳින ලද ශිල්පියා කවුරුන් ද?

.................................................................................................................................

09 පෙරියතම්බි සුබ්‍රමණියම් නිර්මාණය කළ අගස්තියර් හා විනායගර් නැමති සිතුවම දක්නට ලැබෙන කෝවිල කුමක් ද?

.................................................................................................................................

10 ''රත්වත්තෙ අලංකාරය'' කුමන ජන කලාවක් හා සම්බන්ධ වූවක් ද?

.................................................................................................................................

• අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11 කවියක, නිසඳැසක අර්ථය වඩා තීව්‍ර වන ආකාරයට අඳිනු ලබන සිතුවම් හැඳින්වෙන්නේ,

(1) පෝස්ටර් චිත්‍ර (2) රේඛා චිත්‍ර (3) සන්නිදර්ශන චිත්‍ර (4) ග්‍රැෆික් චිත්‍ර

12 දියසායම් මාධ්‍යයෙන් වර්ණ කිරීමේදී ආරක්ෂා කරගත යුතු ප්‍රධාන ශිල්පීය ලක්ෂණය වන්නේ,

(1) දීප්තිමත් වර්ණ යෙදීමයි. (2) විනිවිද පෙනෙන ලෙස වර්ණ යෙදීමයි.

(3) කළු සහ සුදු යොදා වර්ණ යෙදීමයි. (4) සියලු තැන් පිරෙන ලෙස වර්ණ යෙදීමයි.

13 ''මීඩම්හි පාත්තයෝ'' නැමති සුප්‍රසිද්ධ සිතුවම

1. මිස්ටාබා වර්ගයේ සොහොන් ගෙයකින් හමුවූවකි.
2. නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවූවකි.
3. මිසර දේවස්ථානයකින් හමුවූවකි.
4. ආක්නේටන් රජුගේ නිර්මාණයකි.

14 මාරපරාජය දක්වෙන අවස්ථාවේදී බුදුන් වහන්සේගෙන් නිරූපණය කෙරෙන මුද්‍රාව වන්නේ,

(1) අභය මුද්‍රාවයි. (2) විතර්ක මුද්‍රාවයි. (3) ධර්මචක්‍ර මුද්‍රාවයි. (4) භූමි ස්පර්ශ මුද්‍රාවයි.


15 ග්‍රීසියේ ඔලිම්පියාවෙන් හමුවූ විශිෂ්ට කිරිගරුඬ නිර්මාණයක් වන හර්මිස් සහ ඩයොනීසස් (Hermes & Dionysus) මූර්තිය නෙළන ලද්දේ,

(1) මයිරන් ය. (2) ප්‍රැක්සිටෙලීස් ය. (3) පීඩියස් ය. (4) ඇලෙක්සැන්ඩ්‍රෝස් ය.

● ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති රූප සටහන්වලට වඩාත් සෘජු සබඳතාවක් දක්වෙන රූප සටහන **A, B, C, D, E** යන රූප අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

16.  ....................................  A

17.  ....................................  B

18.  ....................................  C

19.  ....................................  D

20.  ....................................  E

● අංක 21 සිට 25 තෙක් දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.

21 ඉන්දු නිම්න වැසියන් සැරසිලි සහිත ඇඳුම් භාවිත කළ බවට ........................................ මූර්තිය සාක්ෂි දරයි.

22 ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව සඳකඩපහණේ ඇති හංසාවලියෙන් ........................................ සංකේතවත් වේ.

23 ඉටි හා මැටි භාවිතයෙන් අච්චුවක් සකස්කර උණුකරගත් පිත්තල එයට වත්කිරීමෙන් භාණ්ඩ නිපදවාගන්නා ශිල්ප ක්‍රමය ........................................ ලෙස හැඳින්වේ.

24 ''ඇසල පෙරහැර'', ''ලක්ෂ්මිගේ උපත'' ආදී ප්‍රසිද්ධ සිතුවම් රැසක් බිහිකළ ........................................ මහතාගේ නිර්මාණවල පසුබිම් අවකාශ සනිකවාදී කලාවේ ආභාසය සහිතය.

25 අනුරාධපුර හා මහනුවර චිත්‍ර සම්ප්‍රදායට සමාන ලක්ෂණ පෙන්වන සිතුවම් දක්නට ලැබෙන ........................................ I වන පරාක්‍රමබාහු රජු ඉදිකරවන ලද හින්දු වාස්තු විද්‍යාත්මක ආභාසය සහිත පිළිමගෙයකි.

● ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට G, H, I, J, K යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.

|  |  |  |  |  |
|---|---|---|---|---|
| G | H | I | J | K |

26 G අක්ෂරයෙන් දැක්වෙන කලාකෘතිය නිර්මාණය කිරීමට ........................................ මාධ්‍ය යොදාගෙන ඇත.

27 H අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාවේ දකුණු අතින් ........................................ මුද්‍රාව නිරූපණය වේ.

28 I අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය කර්මාන්තයක් ලෙස වඩාත් ප්‍රචලිත ප්‍රදේශය වන්නේ ........................................ යි.

29 J අක්ෂරයේ දැක්වෙන ඉසුරුමුණි පෙම් යුවල කැටයම තුළින් ........................................ කලා සම්ප්‍රදායේ ලක්ෂණ නිරූපණය වේ.

30 K අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය නිර්මාණය කිරීම සඳහා ........................................ මාධ්‍ය යොදාගෙන තිබේ.

● අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

31 පර්යාලෝකය ........................................

32 සිරස්පත ........................................

33 වර්ණතානය ........................................

34 ස්ක්‍රයිබ් ........................................

35 පැන්හල්ගල ........................................

● ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති රූප ඵලකය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ වන පරිදි අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.



36 හඳුනාගත් බව ........................................

37 තේමාව ........................................

38 ශෛලිය ........................................

39 වර්ණ භාවිතය ........................................

40 ශිල්පීය කුසලතා ........................................

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු**
**First Term Test, March 2019**

**11 ශ්‍රේණිය**
**Grade 11**

**චිත්‍ර කලාව - II**

**පැය දෙකයි**
**Two hours**

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර

1. රේඛා මගින් පූර්ව අවධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න.

- රේඛා අධ්‍යයනය

1. රේඛා අධ්‍යයනය හා වර්ණ චිත්‍රය යන දෙකම එකට අමුණා භාර දෙන්න.
2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කරන්න.
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දක්වීම.
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් හා සමස්ත නිමාව

සැ.යු.:

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාලව ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස්කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

## චිත්‍ර කලාව - III

පැය දෙකයි
Two hours

සැලකිය යුතුයි

- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 30 ක් හිමිවේ.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- පහත "අ", "ආ" කොටසින් හෝ "ඉ" කොටසින් එක් මාතෘකාවක් තෝරාගෙන නිර්මාණය කරන්න.

---

### "අ" කොටස - චිත්‍ර සංරචනය

01 සන්ද්‍යාවේ නිවෙස බලා යන ගොවියෙක් හා ගෙවිලියක්

02 "වැල්ලට ඔරු ඇවිල්ලා" තේමාවට චිත්‍රයක්

03 හිමිදිරියේ වනාන්තරයක ඇති දිය කඩිත්තක දියබොන මුවන් රංචුවක්

04 "දිරාගිය ගස් සහිත තැනිතලා භූමියක්" රේඛාවට මුල් තැනක් දෙමින් භූමි දර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

06 සාම්ප්‍රදායික සැරසිලි ආශ්‍රිත වූ මල්, කොළ යෙදූ දොර රෙදි මෝස්තරයක් (අඩි 6 x 3 ප්‍රමාණයට ගැලපෙන පරිදි) නිර්මාණය කරන්න.

07 ජ්‍යාමිතික හැඩතල සහිත වූ ව්‍යාප්ත මෝස්තරයක් යෙදූ මල් බඳුනකට සුදුසු නිර්මාණයක් කරන්න.

08 විදුලිපහන් ආවරණයක් සඳහා සුදුසු සැලැස්මක් ඇඳ මෝස්තර යොදා අලංකරණය කරන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

09 ජංගම දුරකථන භාවිතයේ ඇති ප්‍රතිවිපාක පිළිබඳව කියැවෙන කාටූන් චිත්‍රයක් නිර්මාණය කරන්න.

10 "අපි වවමු - රට නගමු" මැයෙන් පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.

11 දූව බිතු කැටයමක් සඳහා සුදුසු නිර්මාණයක් කරන්න. ඊට "සොබාදහම" තේමාව ලෙස යොදාගන්න.

## පිළිතුරු පත්‍රය

(01) වාහල්කඩ (02) අනුරාධපුර (03) ගඩොලින් (04) බුද්ධ රූප / දේව රූප

(05) සතර දිශාව (06) ගඩලාදෙණිය විහාරය / සද්ධර්මතිලක විහාරය (07) දෙවරගම්පල සිල්වත් තැන

(08) මයිකල් ආන්ජිලෝ (09) ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල (10) කලාල කර්මාන්තය

(11) 3 - සන්නිදර්ශන චිත්‍ර (12) 2 - විනිවිද පෙනෙන ලෙස වර්ණ යෙදීමයි.

(13) 1 - මිස්ටාබා වර්ගයේ සොහොන් ගෙයකින් හමුවූවකි. (14) 4 - භූමි ස්පර්ශ මුද්‍රාවයි.

(15) 2 - ප්‍රැක්සිටෙල්ස්ය (16) D (17) A (18) B (19) E (20) C

(21) පූජක රූපය (22) සසර දුකින් මිදීම / නිවන් මගට පිවිසීම (23) ඉටි වාත්තු ක්‍රමය

(24) ස්ටැන්ලි අබේසිංහ (25) තිවංක පිළිමගෙය (26) කළුගල් (27) විතර්ක

(28) අම්බලන්ගොඩ (29) ගුප්ත (30) ලෝකඩ / ලෝහ

(31) සිතුවමක දුර, ළඟ ස්වභාවය / ඈතින් පෙනෙනදේ කුඩාවට හා ළඟින් පෙනෙනදේ විශාලව දැක්වීමේ ක්‍රමයි.

(32) බුදුන්ගේ හිසින් නිකුත්වූ රශ්මි ධාරාව සංකේතවත් කිරීමට යෙදූ අංගය

(33) වර්ණයක ප්‍රභේද / එක් වර්ණයක ලා පැහැයේ සිට තද පැහැය දක්වා වූ විවිධ අවස්ථාවන් ය.

(34) මිසර මූර්තියකි / ස්වාමියා පවසන දේ සාවධානව අසා සිට ලිවීමට සැරසී සිටින ආකාරය දක්වෙන පුද්ගල මූර්තියයි.

(35) ගම්පල යුගයට අයත් ලංකාතිලක විහාරය ඉදිකර ඇති ගල් පර්වතය හැඳින්වෙන නමයි.

(36) මෙම රූපයෙන් දක්වෙන්නේ ඒ. සී. ජී. එස්. අමරසේකර මහතාගේ යකැදුරාගේ දියණිය නම් සිතුවමයි.

(37) චිත්‍රයෙන් නිරූපණය කර ඇත්තේ යකැදුරාගේ දියණියයි. / බලි ශාන්ති කර්මවල ඇඳුම් ආයිත්තම්, ඇඳ පැළඳ සිටින අතර හදිසියේ දොර පියන මත වැටුණ ආලෝකයක් දැකීමෙන් බියට පත් යකැදුරාගේ දියණියයි.

(38) යථාර්ථවාදී ශෛලිය / තාත්වික ශෛලිය අනුගමනය කර තිබේ.

(39) ප්‍රධාන වශයෙන් උෂ්ණ වර්ණ මාලාවක් භාවිත කර කියරොස්කුරෝ ශිල්ප ක්‍රමය අනුව අඳුර ආලෝකය මනාලෙස මතුකර තිබීම / ඒක වාර්ණික ලක්ෂණ

(40) මුහුණේ බියජනක හැඟීම් / බිත්තිවල එල්ලා ඇති වෙස්මුහුණු, විශාල හෙවනැල්ල ආදිය මගින් භයානක රසය වැඩිකිරීමට සමත්වීම / රූප වර්ණ අර්ථාන්විතව භාවිත කිරීම / පෙරබිම මත ප්‍රධාන රූපය හා පසුබිම මගින් නිවසේ අභ්‍යන්තර බිත්තිය සංරචනය කර තිබීම / යකැදුරු දියණියගේ බියවූ ඉරියව්ව ස්වභාවික ලෙස දැක්වීම.

| | | | |
|---|---|---|---|
| (I) - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| (II) - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| (III) - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | මුළු ලකුණු | = | 100 |